# ශ්‍රී ලංකා අධ්‍යාපන අමාත්‍යාංශය අන්තර්කරණ අධ්‍යාපනය සඳහා වූ මහා සැලැස්මකට මුල පුරයි



ශ්‍රී ලංකාවේ දුබලතා සහිත ළමයින් බොහෝ දෙනෙකු පාසල්වල සාමාන්‍ය පන්ති කාමරවල සහ විශේෂ අධ්‍යාපන ඒකකවල අධ්‍යාපනය ලබමින් සිටින බව ශ්‍රී ලංකා අධ්‍යාපන අමාත්‍යාංශය වාතර්‍ා කරයි[1]. කෙසේ වෙතත්, ශ්‍රී ලංකාවේ දුබලතා සහිත ළමයින් සඳහා අන්තර්කරණ අධ්‍යාපන පිළිවෙත් පිළිබඳව එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල හෙවත් UNICEF විසින් පළ කර තිබෙන ජාතික පැතිකඩ වාතර්‍ාවෙන් හෙළි වන්නේ ආබාධ සහිත ළමයින් අධ්‍යාපනය ලබාගැනීම සහ අධ්‍යාපනික වශයෙන් සාථර්ක වීම සම්බන්ධයෙන් එකිනෙක බැඳුණු බාධා රැසක් තවමත් පවතින බවයි[2]. විශේෂයෙන් අන්තර්කරණ අධ්‍යාපනය පිළිබඳ ගුරුවරුන්ගේ කුසලතා සීමිත වීම, පාසල්වල සුදුසු සහ ප්‍රවේශ විය හැකි යටිතල පහසුකම් නොමැතිකම සහ විෂයමාලාවල සීමිතබව යනාදිය මෙම බාධා අතර වේ.

ශ්‍රී ලංකා අධ්‍යාපන අමාත්‍යාංශය, ජපන් ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනයේ (JICA) තාක්ෂණික සහයෝගීතාවෙන් අන්තර්කරණ අධ්‍යාපන ප්‍රවේශය (REACH-SS) වැඩසටහන හරහා විශේෂ අවශ්‍යතා සහිත ළමුන් සඳහා අන්තර්කරණ අධ්‍යාපනය ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කරයි.

2000 වෂර්යේ නිකුත් කරන ලද අධ්‍යාපන අමාත්‍යාංශයේ අන්තර්කරණ අධ්‍යාපන චක්‍රලේඛය ක්‍රමානුකූලව සාරථකව ක්‍රියාත්මක කර ගැනීම සඳහා පාශර්වකරුවන් අතර පොදු අවබෝධය ප්‍රවධර්නය කිරීම සඳහා මධ්‍යම කාලීනව (වසර 3) සහ දිගු කාලීන (අවුරුදු 5-10) සැලැසුම් සකස් කිරීම සඳහා කාය‍ර් සාධක බලකායක් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පත් කර ඇත. REACH-SS සහ අනෙකුත් සංවධර්න හවුල්කරුවන්ගේ නියාමක ක්‍රියාකාරකම්වල ප්‍රතිඵල ඒ සමග සම්බන්ධ කර තිබේ.

මෙම කාය‍ර් සාධක බලකායේ පළමු රැස්වීම 2022 අප්‍රේල් 6 වැනි දින පවත්වන ලදී. එහිදී *2019-2030 අන්තර්කරණ අධ්‍යාපන සැලැස්ම* නැවත සලකා බැලීමෙන් පසු අධ්‍යාපන අමාත්‍යාංශයේ අන්තර්කරණ අධ්‍යාපන චක්‍රලේඛයට අනුකූල වන පරිදි එම සැලැස්ම යාවත්කාලීන කිරීම සඳහා මාගර් සිතියමක් සකස් කරන ලදී. ඒ අනුව, එම ක්‍රියාවලිය සඳහා විශේෂඥ සහාය ලබා ගනිමින් අන්තර්කරණ අධ්‍යාපනය සඳහා මහා සැලැස්මක් කෙටුම්පත් කිරීමේ ක්‍රියාවලියක් ආරම්භ කරන ලදී.

---

1 Number of children with disabilities enrolled in regular and special education units in schools, 2012, Ministry of Education, Education Sector Development Framework and Programme (ESDFP) 2013–2017, Ministry of Education Policy and Planning Branch, Battaramulla, 2012 (Figure 1 - https://www.unicef.org/rosa/media/17016/file/Country%20Profile%20-%20Sri%20Lanka.pdf).

2 Disability-Inclusive Education Practices in Sri Lanka, UNICEF, 2021 - https://www.unicef.org/rosa/media/17016/file/Country%20Profile%20-%20Sri%20Lanka.pdf



එම මහා සැලැස්මෙහි අරමුණ වන්නේ ශ්‍රී ලංකාවේ සියලුම ළමයින්ට ඔවුන්ගේ වෙනස්කම් මත අගතියකින් තොරව උසස් තත්ත්වයේ අධ්‍යාපන අවස්ථා ලබාගැනීමේ අවස්ථාව සහතික කිරීමයි. ඒ අනුව, අදාළ පාශර්වයන් විසින් සකස් කරන ලද ක්‍රියාකාරී සැලසුම් බෙදාගැනීමේ අරමුණින් අන්තකර්රණ අධ්‍යාපන (IE) මහා සැලැස්මක් කෙටුම්පත් කිරීම සඳහා වැඩමුළුවක් 2023 සැප්තැම්බර් 12 සහ 13 යන දිනයන්හිදී පවත්වන ලදී. උප කාණ්ඩවල කුලුනු හතර මත පදනම්ව අන්තකර්රණ අධ්‍යාපන මහා සැලැස්ම සංවධර්නය කිරීම එහි තවත් අරමුණකි.

හඳුනාගන්නා ලද කුලුනු හතර මෙසේය:

1. අධ්‍යාපනයට සම්බන්ධ වීම සහ සහභාගීත්වය
2. සියලුම සිසුන් සඳහා ගුණාත්මක අධ්‍යාපනය සඳහා අවස්ථා
3. පාසල්වල අන්තකර්රණ අධ්‍යාපන භාවිතාවන් ශක්තිමත් කිරීම: අධ්‍යාපන පද්ධතියේ ධාරිතා සංවධර්නය
4. අධ්‍යාපන පද්ධතිය තුළ අන්තකර්රණ අධ්‍යාපන සංස්කෘතියක් නිමර්ාණය කිරීම

සියලුම පාශර්වකරුවන්ගේ සහභාගීත්වයෙන් තොරව අන්තකර්රණ අධ්‍යාපනය සම්පූණර් කළ නොහැකිය. කාර්‍ය සාධක බලකායක් පිහිටුවා තිබෙන්නේ ජාතික මට්ටමින් ව්‍යාපෘති අත්දැකීම් බෙදාගැනීම ඔස්සේ අන්තකර්රණ අධ්‍යාපනය සඳහා මහා සැලැස්මක් සකස් කිරීම සඳහාය. අධ්‍යාපන අමාත්‍යාංශය තුළ සහ ඉන් පිටත සිටින අන්තකර්රණ අධ්‍යාපනය හා සම්බන්ධ පුළුල් පරාසයක පාශර්වකරුවන්ට වැඩමුළුවේ සංවිධායකයන් විසින් ආරාධනා කරන ලදී.

වැඩමුළුවට සහභාගී වූවන් අතර අධ්‍යාපන අමාත්‍යාංශයේ නොවිධිමත් සහ විශේෂ අධ්‍යාපන ශාඛාව, මානව සම්පත් සංවධර්න ශාඛාව, අධීක්ෂණ සහ කාර්‍ය සාධන සමාලෝචන ශාඛාව, පයෙර්ෂණ සහ සංවධර්න ශාඛාව, ප්‍රාථමික අධ්‍යාපන ශාඛාව, සැමට අධ්‍යාපනය ශාඛාව, පාසල් වැඩ ශාඛාව, පාසල් ක්‍රියාකාරකම් ශාඛාව, ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ ශාඛාව, විෂය සමගාමී, මාගෙර්ාපදේශන සහ උපදේශන ශාඛාව, ශාරීරික අධ්‍යාපන සහ ක්‍රීඩා ශාඛාව, විභාග දෙපාතර්මේන්තුව, ජාතික විශේෂ සහ අන්තකර්රණ අධ්‍යාපන ආයතනය, ජාතික අධ්‍යාපන ආයතනයේ අන්තකර්රණ අධ්‍යාපන හා ප්‍රාථමික අධ්‍යාපන අංශ, සමාජ සේවා දෙපාතර්මේන්තුව, සෞඛ්‍ය අමාත්‍යාංශයේ පවුල් සෞඛ්‍ය කාර්‍යාංශය, මුල් ළමාවිය සංවධර්න ජාතික ලේකම් කාර්‍යාලය සහ ආබාධ සහිත පුද්ගලයන් සඳහා වන ජාතික ලේකම් කාර්‍යාලය, JICA, UNICEF, Save the Children යන ආයතනවල නියෝජිතයන් සිටි අතර පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ මහාචාර්‍ය ලීනා මහත්මිය සහ විවෘත විශ්වවිද්‍යාලයේ කේතීස්වරන් මහතා නිරීක්ෂකයින් ලෙස සහභාගී වූහ.



වැඩමුළුව විවෘත කරමින් ජාතික අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් මහාචාර්ය ප්‍රසාද් සේතුංග මහතා පෙන්වා දුන්නේ ශ්‍රී ලංකාවේ විශ්ව විද්‍යාල අධ්‍යාපන පීඨ සිය අධ්‍යාපනවේදී උපාධි පාඨමාලා සහ පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලා තුළ අන්තකර්රණ අධ්‍යාපනය කෙරෙහි අවධානය යොමු කර ඇති බවයි. එහි අරමුණ පන්ති කාමර තුළ අන්තකර්රණ අධ්‍යාපනය භාවිතා කරන අධ්‍යාපනවේදීන් සමූහයක් නිමර්ාණය කිරීමයි. ‘‘අන්තකර්රණ අධ්‍යාපනය ආරම්භ වන්නේ ඉගෙනුම් ප්‍රතිඵල සරල කිරීමෙනුයි. එසේ කිරීමෙන් ගුරුවරුන්ට සියලුම සිසුන් සමඟ පාඩමේ අරමුණු ප්‍රායෝගිකව සාක්ෂාත් කරගත හැකියි. අධ්‍යාපන අමාත්‍යාංශය විසින් මේ සම්බන්ධයෙන් සවිස්තරාත්මක චක්‍රලේඛයක් නිකුත් කර තිබෙනවා. මෙම ව්‍යාපෘතියේ ප්‍රගතිය පිළිබඳව අමාත්‍යවරයා ද දැඩි උනන්දුවක් දක්වනවා. ඒ නිසා අපි එකතුවෙලා මේ මහා සැලැස්කම සැකසීම අවසන් කරන්නට කටයුතු කරමු,’’ යි ඔහු පැවසීය.

විවිධ අංශවල නියෝජිතයින් විසින් එක් එක් අංශය මහා සැලැස්මට දායක වන ආකාරය පැහැදිලි කරන ලදී. REACH-SS කණ්ඩායම් නායක ෂුහෙයි ඔගුචි මහතා විසින් වැඩමුළුව ආරම්භක අවස්ථාව මෙහෙයවන ලදී.